# බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

**ලංසු දැන්වීමයි**

# 2024/ 2025 වර්ෂ සඳහා දේපළ බදුදීම

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අයත් ජංගම අලෙවි කුටි 5ක් ජංගම අලෙවිසැල් ලෙස භාවිතා කිරීම සඳහා වසරකට (2024 සිට 2025 දක්වා) බදුදීම සඳහා ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

ලංසු ඉල්ලුම්පත් 2024.02.08 දින සිට 2024.02.28 දින දක්වා නිකුත් කරන අතර, ලංසු ඉල්ලුම්පත් ලබාගැනීමට එක් අලෙවි කුටියකට රු. 500.00 ක ලංසු පෝරම ගාස්තු මුදල වෙන වෙනම ගෙවා කාර්යාලයීය දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ ඒ අලෙවි කුටි සඳහා ලංසු මිල ගනන් ඉදිරිපත් කිරීමේදී යොදාගත යුතු අවම ලංසු වටිනාකම, මාසික කුලිය, ආපසු ගෙවන ඇප තැන්පතු මුදල, ලංසු පෝරම ගාස්තු පහත පරිදි වේ.

| වර්ග ප්‍රමාණය (වර්ග අඩි) | අවම ලංසු වටිනාකම (රු.) (ආපසු නොගෙවන එකවර ගෙවන මුදල) | මාසික කුලිය (රු.) | ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල (රු.) | ලංසු පෝරම ගාස්තු (රු.) |
|---|---|---|---|---|
| 6x4x7 | 10,000.00 | 1,000.00 | 3,000.00 | 500.00 |
| | | | | |

ලංසුපත් 2024.02.29 දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ. මුද්‍රා තබන ලද ලංසුපත් පිටපත් දෙකකින් යුතුව එදින පෙ.ව. 10.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව, හෙලමුදුන, බණ්ඩාරවෙල ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. 2024.02.29 වන දින පෙ.ව. 10.00 ට ලංසුපත් භාරගැනීම අවසන් වන අතර එදින පෙ.ව. 10.30 ට ලංසුපත් විවෘත කිරීම සිදු කෙරේ. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පැවරූ නියෝජිතයන්ට එම අවස්ථාව සඳහා සහභාගී විය හැකිය. ටෙන්ඩර්පත් පිළිබඳව පැහැදිලි කරගැනීමට හා අලෙවි කුටි පරීක්ෂා කිරීමට අවශ්‍ය පුද්ගලයින් වේ නම් 057-2222517 අංකයෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඇමතිය හැකිය.

සැ.යු:

- ❖ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ටත්, සේවකයන්ටත්, ඔවුන්ගේ කලත්‍රයාට හෝ ඔහුගෙන් යැපෙන්නන්ට හා ප්‍රාදේශීය සභාව විසින් අසාධු ලේඛණ ගත කර ඇති පුද්ගලයන්ට මේ සඳහා අයදුම් කල නොහැකිය.
- ❖ මෙම ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

සභාපති,<br>
ප්‍රසම්පාදන කමිටුව,<br>
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,<br>
හෙලමුදුන, බණ්ඩාරවෙල.